# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව

## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை

## Media Freedom Rights Monitoring Report

2022 මැයි

2 වන වෙළුම - කලාප අංක 5



අගමැති ආධාරකරුවන්ගෙන් ගෝටාගෝගමට ප්‍රහාරයක්



දර්ශන හඳුන්ගොඩ සීඅයිඩීයට කැඳවයි



වැකඳවල රාහුල හිමි අත්අඩංගුවට

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරාගෙන ඇති විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 35ක් 2022 මැයි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 12ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 19ක්, මාධ්‍යයේ ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 1ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 3ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂකයින් රැඳී සිටි කූඩාරම් පොලිසියෙන් කඩා ඉවත් කිරීම.
2. 'ගෝල්ෆේස් අරගලයට සහභාගී වී ආණ්ඩුවට විරුද්ධව ප්‍රකාශයක් කළැයි' තරුණයකු අත්අඩංගුවට ගැනීම.
3. අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂණය හේතුවෙන් පදිකයන්ට ඇති වී තිබෙන බාධා ඉවත් කිරීමට අධිකරණය නියෝග කිරීම.
4. අර්බුදය හමුවේ පොදු එකඟතාවකට ඒමට අපොහොසත් වන්නේ නම්, දේශපාලනඥයින් වැඩසටහන්වලට සහභාගී කර ගැනීමෙන් වළකින බව ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංසදය ප්‍රකාශ කිරීම.
5. මාධ්‍යවේදීන්ට එරෙහි අපහාසාත්මක සමාජ මාධ්‍ය ප්‍රචාරණයක් සම්බන්ධයෙන් මඩකලපුව මාධ්‍ය සමාජය පැමිණිල්ලක් යොමු කිරීම.
6. පාර්ලිමේන්තුව අසල උද්ඝෝෂණයක නිරතව සිටි තරුණයින් 13 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.
7. අම්පාරේ මාධ්‍යවේදී ෂාහීර් ඛාන් ෆාරුක් වාර්තාකරණයක නිරතව සිටියදී ප්‍රහාරයට ලක් වීම.
8. ආණ්ඩුවට එරෙහිව පවත්වනු ලබන විරෝධතා අතරතුර ළමයින් හිංසනයට ලක් වීම හෙළා දකිමින් UNICEF සංවිධානය නිවේදනයක් නිකුත් කිරීම.

9. 2022 මැයි මස 6 වන දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම.

10. පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගය අසල උද්ඝෝෂණයේ නිරතව සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ සිසුන්ට කඳුළුගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීම.

11. හර්තාලයට සහභාගී වූ රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස් කිරීමට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කිරීම.

12. ගෝල්ෆේස් අරගලභූමිය හේතුවෙන් මහජන පීඩාවක් සිදු වන බවට කොටුව පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කිරීම.

13. හදිසි නීතිය ගැන විමසීමට, ජනපති ලේකම්, ආරක්ෂක ලේකම් සහ පොලිස්පති, මානව හිමිකම් කොමිසම හමුවට කැඳවීම.

14. අරලියගහ මන්දිරය ඉදිරිපිට සහ ගෝල්ෆේස් අරගලභූමිවලට හා අරගලකරුවන්ට ආණ්ඩුපක්ෂයේ ආධාරකරුවන් පහරදීම.

15. මානව හිමිකම් හා සිවිල් නිදහස ආරක්ෂා කරන ලෙස ෆැන්සින් පාප්වහන්සේ ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.

16. අරලියගහ මැදුර ඉදිරිපිට සහ ගෝල්ෆේස් අරගලභූමිවලට හා උද්ඝෝෂකයින්ට පහරදීමේ සිදුවීමට අදාළව හිටපු අගමැතිවරයා ඇතුළු 17 දෙනෙකුගේ විදෙස් ගමන් තහනම් කිරීමට අධිකරණය නියෝග කිරීම.

17. හිටපු අගමැතිවරයා ඇතුළු 7 දෙනෙකු අත්අඩංගුවට ගැනීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලමින් නීතිඥවරයෙක් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

18. 'ගෝඨාගෝගම' අරගල භූමියට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා සංවිධාන දෙකක් පොලිස්පතිවරයාට ලිපියක් භාරදීම.

19. සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ අදහස් පළ කිරීම් හේතුවෙන්, රූපවාහිනී නිවේදිකාවක අත්අඩංගුවට ගැනීම.

20. මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධිකරණයේ ස්වාධීනත්වයට සිදු කරන ලද බලපෑමක් පිළිබඳව පාර්ලිමේන්තුවේදී හෙළිදරව් වීම.

21. 'බුදුන්ගේ රස්තියාදුව' නමින් කෘතියක් ලියා පළ කිරීම සම්බන්ධයෙන් එම කෘතියේ රචකයාට සහ ප්‍රකාශකට එරෙහිව නඩු පැවරීම.

22. පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ වාර්තාකරණයේ නිරතව සිටි මාධ්‍යවේදීන් දෙදෙනකුට පහර දී ජංගම දුරකථන උදුරා ගැනීම.

23. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ නඩු විභාගය, නෙදර්ලන්තයේ හේග් නුවරදී "මාධ්‍යවේදීන් ඝාතනය පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය" හමුවේ ආරම්භ වීම.

24. නිදහස් මාධ්‍යවේදිනී පුෂ්පා වීරසේකර සහ ඇගේ ස්වාමිපුරුෂයා, ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ ව්‍යාජ පැමිණිල්ලක් මත පොලිසියට කැඳවීම.

25. ෆේස්බුක් ඔස්සේ අදහස් පළ කිරීම නිසා හැටන් ප්‍රදේශයේ තරුණසේවා නිලධාරියකු අත්අඩංගුවට ගැනීම.

26. මුතූර් ප්‍රදේශයේ ඉන්ධන පෝලිමක් රූගත කරමින් සිටියදී මාධ්‍යවේදී මොහොමඩ් බුහාරිට පහර දීම.

27. වාරියපොළ ඉන්ධන පිරවුම්හලක් අසල වාර්තාකරණයක නිරතව සිටියදී මාධ්‍යවේදී අශෝක චන්ද්‍රසේකරට පහරදීම.

28. මාධ්‍යවේදී දර්ශන හඳුන්ගොඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවීම.

29. සමාජ ක්‍රියාකාරික ඉන්දික ගමගේ අත්අඩංගුවට ගැනීම.

30. විරෝධතාකරුවන්ට කොළඹ මාර්ග කිහිපයකට ඇතුළුවීම වළක්වාලමින් අධිකරණය තහනම් නියෝගයක් නිකුත් කිරීම.

31. සිරකරු අයිතීන් සුරැකීමේ කමිටුවේ සභාපති නීතිඥ සේනක පෙරේරා මානව හිමිකම් කොමිසම හමුවට කැඳවා ප්‍රශ්න කිරීම.

32. සමාජ මාධ්‍යවේදියකු හා ක්‍රියාකාරිකයකු වන රතිඳු සේනාරත්න (රැට්ටා) අත්අඩංගුවට ගැනීම.

33. ජන අරගලයේ ක්‍රියාකාරිකයින් වන භික්ෂූන්වහන්සේලා තිදෙනෙකු වීරකැටිය පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.

34. වසර 18කට පෙර ඝාතනයට ලක් වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී අයියතුරෙයි නඩේසන් අනුස්මරණය කිරීම.

35. හිටපු අගමැති මහින්ද රාජපක්ෂ ඇතුළු මැති ඇමතිවරුන් පිරිසක් මානව හිමිකම් කොමිසමට කැඳවීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 මැයි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 12 |
| නීතිමය කොන්දේසි | 19 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| **එකතුව** | **35** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස බරපතළ ලෙස උල්ලංඝනය වූ අවස්ථා 12ක් මැයි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ට ප්‍රහාර එල්ල වූ අවස්ථා පහක් නිරීක්ෂණය වූ අතර, පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ දී මාධ්‍යවේදීන් දෙදෙනෙකුට මන්ත්‍රීවරුන් විසින් පහරදුන් අවස්ථාවක්ද ඒ අතර වෙයි.**

**2 වගුව: 2022 මැයි : මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 12**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රහාර | 07 |
| මානසික බලපෑම් | 05 |
| **එකතුව** | **12** |

1. **අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂකයින් රැඳී සිටි කූඩාරම් පොලිසියෙන් කඩා ඉවත් කිරීම.**

   අගමැතිවරයාට ඉල්ලා අස් වන ලෙස බල කරමින් අරලියගහ මන්දිරය ඉදිරිපිට 'මයිනාගෝගම' ලෙස නම් කළ විරෝධතා භූමියේ කූඩාරම් මැයි 01 වැනිදා අලුයම පොලිසිය විසින් කඩා ඉවත් කරන ලදි. එහිදී විරෝධතාකරුවන් දෙදෙනෙකු පොලිස් පොලිසියේ ප්‍රහාරයට ලක් විය.

   මූලාශ්‍ර: 1. https://www.youtube.com
   2.https://www.gossiplankanews.com

2. **මාධ්‍යවේදීන්ට එරෙහි අපහාසාත්මක සමාජ මාධ්‍ය ප්‍රචාරණයක් සම්බන්ධයෙන් මඩකලපුව මාධ්‍ය සමාජය පැමිණිල්ලක් යොමු කිරීම.**

   පා.ම. ශිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්ට එරෙහිව උද්ඝෝෂණය කිරීමට ජනතාව පොළඹවන ලදැයි චෝදනා කරමින්, ආණ්ඩුවට සහාය දෙන පක්ෂයක ආධාරකරුවන් දෙදෙනෙකු විසින් පුණ්‍යමූර්ති සසිකරන් සහ සෙල්වකුමාර් නිලන්තන් යන මාධ්‍යවේදීන්ට එරෙහිව මෙම සමාජ මාධ්‍ය පළ කිරීම් සිදු කර ඇත. ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන ලෙස මඩකලපුව මාධ්‍ය සමාජය, ඉහත ලිපියෙන් මඩකලපුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගෙන් ඉල්ලා සිටී. මීට අමතරව අදාළ මාධ්‍යවේදීන් පොලිස්පතිවරයා වෙතද පැමිණිල්ලක් යොමු කර තිබේ.

   මූලාශ්‍රය: http://www.themorning.lk

3. **අම්පාරේ මාධ්‍යවේදී ෂාහීර් ඛාන් ෆාරුක් වාර්තාකරණයක නිරතව සිටියදී ප්‍රහාරයට ලක් වීම.**

   මැයි 5 රාත්‍රියේ අක්කරපත්තුව නැගෙනහිර නගරයේ පාලමුනේ ප්‍රදේශයේ පොලීසිය සහ ප්‍රදේශවාසීන් අතර ඇති වූ ගැටුමක් වාර්තා කරමින් සිටියදී කිසියම් පිරිසක් ඔහුට පහර දී ඇති අතර පසුව ඔහු ප්‍රතිකාර සඳහා අක්කරේපත්තුව මූලික රෝහලට ඇතුළත් කෙරිණි.

   මූලාශ්‍රය: https://twitter.com

4. **පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගය අසල උද්ඝෝෂණයේ නිරතව සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ සිසුන්ට කඳුළුගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීම.**

ආණ්ඩුවට විරෝධය පළ කරමින් මැයි 5 වැනිදා සවස ආරම්භ වූ මෙම විරෝධතාව එදින රාත්‍රිය මුළුල්ලේ සහ පසුදා සවස් වනතුරු පැවැත්වුණු අතර පොලිසිය අවස්ථා ගණනාවකදී ඊට කඳුළුගෑස් සහ ජල ප්‍රහාර එල්ල කළේය. මාර්ගයේ ගමන් ගත් ජනතාවද එම ප්‍රහාරවලින් පීඩාවට ලක් විය. මෙම ප්‍රහාරවලට නියෝග ලබාදුන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චන්දන කොඩිතුවක්කුට එරෙහිව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් පරිදි පොලිස්පතිවරයා විසින් විමර්ශනයක් ආරම්භ කරන ලදි.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://sinhala.srilankamirror.com

5. **හර්තාලයට සහභාගී වූ රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස් කිරීමට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කිරීම.**

ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුවට ඉල්ලා අස් වන ලෙස බල කරමින් දීප ව්‍යාප්ත හර්තාල් ව්‍යාපාරයක් ක්‍රියාත්මක වූ මැයි 6 වැනිදා සේවයට වාර්තා නොකළ නිලධාරීන් පිළිබඳව තොරතුරු වාර්තා කළ යුතු බවට චක්‍රලේඛයක්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර තිබේ.

මූලාශ්‍රය: https://si.rata.lk

6. **අරලියගහ මන්දිරය ඉදිරිපිට සහ ගෝල්ෆේස් අරගලභූමිවලට හා අරගලකරුවන්ට ආණ්ඩුපක්ෂයේ ආධාරකරුවන් පහරදීම.**

අගමැතිවරයා කැඳවා තිබූ රැස්වීමකින් පසුව අරලියගහ මන්දිරයේ සිට පිටතට පැමිණි විශාල පිරිසක් පළමුව ඒ ඉදිරිපිට පැවති 'මයිනාගෝගම' උද්ඝෝෂකයන්ට පහර දී කූඩාරම් කඩා ගිනි තැබූ අතර පසුව ගෝල්ෆේස් අරගලකරුවන්ට පහර දී අරගලභූමියේ කූඩාරම් විනාශ කර දැමූහ. මෙහිදී උද්ඝෝෂකයින් 30 දෙනෙකු පමණ තුවාල ලබා රෝහල්ගත කෙරිණි. පොලිසිය මෙම ප්‍රහාරය වැළැක්වීමට කටයුතු නොකළේ, ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා හා පොලිස්පතිවරයා විසින් කල්තියා දී තිබූ උපදෙස් මත බව අමාත්‍ය රමේෂ් පතිරණ මැයි 18 දා පාර්ලිමේන්තුවේදී හෙළි කළේය. මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු අගමැති මහින්ද රාජපක්ෂ, නාමල් රාජපක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු 17 දෙනෙකුගේ විදෙස් ගමන් තහනම් කරමින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මැයි 12 වැනිදා නියෝගයක් නිකුත් කළේ ය. ඒ සමග ප්‍රහාරයේ වින්දිතයන් හා සාක්ෂිකරුවන් 7 දෙනෙකුගේද විදෙස් ගමන් තහනම් කෙරිණි.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://girayanews.lk

7. **පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ වාර්තාකරණයේ නිරතව සිටි මාධ්‍යවේදීන් දෙදෙනකුට පහර දී ජංගම දුරකථන උදුරා ගැනීම.**

මැයි 17 වැනිදා ජංගම දුරකථන භාවිත කරමින් වාර්තාකරණයෙහි නිරතව සිටි සිරස කසුන් සමරවීර (සිරස) සහ ප්‍රගීත් පෙරේරා (ස්වර්ණවාහිනිය) මාධ්‍යවේදීන් මෙසේ ප්‍රහාරයට ලක් වූ අතර, ඉන්දික අනුරුද්ධ සහ ඩී. වීරසිංහ යන ආණ්ඩුපක්ෂ මන්ත්‍රීවරුන් මෙම පහරදීම හා පැහැරගැනීම සිදු කර තිබේ. අගතියට පත් මාධ්‍යවේදීන් මේ සම්බන්ධයෙන් කතානායකවරයාටත් වැලිකඩ පොලිසියටත් පැමිණිලි කර ඇත. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සිදුවීම හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කළේය.

මූලාශ්‍රය: https://www.youtube.com

8. **නිදහස් මාධ්‍යවේදිනී පුෂ්පා වීරසේකර සහ ඇගේ ස්වාමිපුරුෂයා, ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ ව්‍යාජ පැමිණිල්ලක් මත පොලිසියට කැඳවීම.**

ආණ්ඩුවට එරෙහි ජන අරගලයට පිරිස් මෙහෙයවමින්, අදාළ ප්‍රාදේශීය දේශපාලනඥයාගේ නිවසට පහරදීමට ගිය බවට කළ පැමිණිල්ලක් මත මෙම මැයි 16 වැනිදා වාරියපොළ පොලිසිය මගින් කැඳවීම සිදු කර ඇත. ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු දක්වමින් මාධ්‍යවේදිනිය ප්‍රකාශ කරන්නේ එය සම්පූර්ණයෙන්ම අසත්‍ය පැමිණිල්ලක් බවයි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

9. **මුතූර් ප්‍රදේශයේ ඉන්ධන පෝලිමක් රූගත කරමින් සිටියදී මාධ්‍යවේදී මොහොමඩ් බුහාරිට පහර දීම.**

මුතූර් සිරස හා ශක්ති ටී.වී. ප්‍රාදේශීය මාධ්‍යවේදී මොහොමඩ් බුහාරි මැයි 21දා රාත්‍රියේ මෙම ප්‍රහාරයට ලක්ව ඇති අතර පසුව මුතූර් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන තිබේ. ඉන්ධන පෝලිමේ ගැලුම් අතැතිව සිටි පිරිසක් ඔහුට අතින්, පයින් සහ හෙල්මට්වලින් පහර දී ඇත. සිද්ධිය පිළිබඳව මුතූර් පොලිසියට පැමිණිලි කර තිබේ.

මූලාශ්‍රය: https://mawbima.lk

10. **වාරියපොළ ඉන්ධන පිරවුම්හලක් අසල වාර්තාකරණයක නිරතව සිටියදී මාධ්‍යවේදී අශෝක චන්ද්‍රසේකරට පහරදීම.**

මැයි 23 වැනිදා, කුරුණෑගල, අනුරාධපුර පාරේ,

මිනුවන්ගැටේ සිපෙට්කෝ පිරවුම්හලෙන් විශාල ප්‍රමාණයේ කෑන්වලට ඉන්ධන ලබා දීමේ සිදුවීමක් ජංගම දුරකථනයෙන් රූගත කරමින් සිටියදී, එම ඉන්ධන ලබාගත් පුද්ගලයන් මෙම ප්‍රහාරය එල්ල කර ඇත. ප්‍රහාරයට ලක්වූ මාධ්‍යවේදියා ගිලන් රථයකින් රැගෙන ගොස් නිකවැරටිය රෝහලට ඇතුළත් කර ඇති අතර ඔහුගේ ඇසකට හා පිටකොන්දට තදබල ලෙස පහර දී ඇතැයි අනාවරණය විය. වාරියපොළ පොලිසියට මේ පිළිබඳව පැමිණිලි කර තිබේ.

මූලාශ්‍රය: https://si.rata.lk

11. **මාධ්‍යවේදී දර්ශන හඳුන්ගොඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවීම.**

මැයි 25 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස දුරකථනයෙන් ඔහුට දැනුම් දී තිබූ අතර විධිමත් කැඳවීමක් නොමැති වීම හේතුවෙන් ඔහුගේ නීතිඥයන් එදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ගොස් කරුණු දැක්වීමෙන් අනතුරුව මැයි 31 වැනිදා ඔහුට පරිගණක අපරාධ අංශය හමුවේ පෙනී සිටින ලෙස දැනුම් දී තිබිණි. සමාජ මාධ්‍ය ඔස්සේ ජනතාව කුපිත කළ බවට, ඔහුට එරෙහිව පොලිස්පතිවරයාට ලැබුණු පැමිණිල්ලක් මත මෙම විමර්ශනය සිදු කරන බව එහිදී පොලිසිය දැනුම් දී තිබේ.

මූලාශ්‍ර: 1. https://theleader.lk
2. https://www.youtube.com

12. **සිරකරු අයිතීන් සුරැකීමේ කමිටුවේ සභාපති නීතිඥ සේනක පෙරේරා මානව හිමිකම් කොමිසම හමුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

මැයි 9 වැනිදා ගෝඨාගෝගමට එල්ල කළ ප්‍රහාරයට සිරකරුවන් යොදාගෙන ඇතැයි සැක මතු වන බවට කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් මෙම ප්‍රශ්න කිරීම සිදු කර තිබේ. කොමිසමේ සාමාජිකයකු නොවන ජනාධිපති නීතිඥවරයකුද එම ප්‍රශ්න කිරීමට සම්බන්ධ වූ බවත්, මෙය මානව හිමිකම් කොමිසමේ බලතල ඉක්මවා ක්‍රියා කිරීමක් බවත් පවසන නීතිඥ සේනක පෙරේරා, අදාළ ප්‍රශ්න කිරීමට හේතුව පැහැදිලි කරන ලෙස ඉල්ලා, කොමිසමේ සභාපතිනිය වෙත ලිපියක් යොමු කර තිබේ.

මූලාශ්‍රය: https://sinhala.srilankabrief.org

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 19ක් මැයි මාසය තුළ නිරීක්ෂණය විය. එයින් බොහොමයක් ජනාධිපතිවරයාට හා රජයට ඉල්ලා අස් වන ලෙස බල කරමින් පැන නැගුණු විරෝධතාවලට සම්බන්ධ සිදුවීම් වේ. මැයි 9 වැනිදා සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවල චූදිතයන් ලෙස නම් කරමින් සාමකාමී අරගලයේ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම සඳහා පොලිසිය වෑයම් කරන බව, නිරීක්ෂණයට ලක් වූ සිදුවීම් අනුව පැහැදිලිව පෙනෙන කරුණකි.**

**3 වගුව: 2022 මැයි : නීතිමය කොන්දේසි - සිදුවීම් 19**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 16 |
| අධිකරණයේ අපක්ෂපාතී බව | 01 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය | 02 |
| **එකතුව** | **19** |

1. **'ගෝල්ෆේස් අරගලයට සහභාගී වී ආණ්ඩුවට විරුද්ධව ප්‍රකාශයක් කළැයි' තරුණයකු අත්අඩංගුවට ගැනීම.**

සමන් කුමාර රත්නතිලක නම් තරුණයකු මැයි 1 වැනිදා යක්කල පොලිසිය මගින් මෙසේ අත්අඩංගුවට ගෙන ඇති අතර අත්අඩංගුවේදී ඔහුට පහර දී තිබේ. පසුව නිවස තුළ ගංජා වගා කළ බවට ව්‍යාජ චෝදනාවක් මත ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව, ඇප මත නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: https://www.facebook.com

2. **අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂණය හේතුවෙන් පදිකයන්ට ඇති වී තිබෙන බාධා ඉවත් කිරීමට අධිකරණය නියෝග කිරීම.**

කොල්ලුපිටිය පොලිසිය විසින් මැයි 2 වැනිදා කොළඹ, කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගත් මෙම නියෝගය ක්‍රියාත්මක නොකිරීම ගැන මැයි 4 වැනිදා අධිකරණයේදී පොලිසියෙන් ප්‍රශ්න කෙරුණු අතර ඒ පිළිබඳව මැයි 9 වැනිදා කරුණු දැක්වීමට පොලිස් ස්ථානාධිපතිවරයාට හා නීතිපතිවරයාට නියෝග කෙරිණි.

පසුව පොලිසිය විසින් පදික වේදිකාවේ නවතා තිබූ බස් රථ ඉවත් කර ගැනුණු අතර උද්ඝෝෂකයන් විසින් සිය කූඩාරම් ඉවත් කර ගන්නා ලදි. පදිකයින්ට අවහිරයක් නොවන පරිදි උද්ඝෝෂණයේ යෙදීමට බාධාවක් නොමැති බවද අදාළ නියෝගයේ සඳහන් වේ.

මූලාශ්‍රය: https://sinhala.asianmirror.lk

3. **පාර්ලිමේන්තුව අසල උද්ඝෝෂණයක නිරතව සිටි තරුණයින් 13 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

මැයි 04 වැනිදා කතානායකවරයාට ලිපියක් භාර දීමෙන් අනතුරුව පාර්ලිමේන්තු ප්‍රවේශය අසල උද්ඝෝෂණයක නිරතව සිටියදී පොලිසිය මෙම පිරිස අත්අඩංගුවට ගත් අතර කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව ඇප මත මුදාහැරිණි. නීතිඥවරු විශාල පිරිසක් ඔවුන් වෙනුවෙන් පෙනී සිටියහ. මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කළ ශ්‍රී ලංකා නීතිඥ සංගමය, "සාමකාමී ලෙස විරෝධතා දැක්වීමට මහජනතාවට ඇති අයිතියට ගරු කළ යුතු අතර එය තහවුරු කළ යුතු බව" යළි අවධාරණය කළේය.

මූලාශ්‍ර: 1. https://www.bbc.com
2. https://www.newswire.lk

4. **හදිසි නීතිය ගැන විමසීමට, ජනපති ලේකම්, ආරක්ෂක ලේකම් සහ පොලිස්පති, මානව හිමිකම් කොමිසම හමුවට කැඳවීම.**

හදිසි නීතිය පැනවීමට ජනාධිපතිවරයා ගත් තීරණය සම්බන්ධයෙන් කරුණු දක්වන ලෙස ජනාධිපති ලේකම් ගාමිණී සෙනරත්, ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න සහ පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න යන නිලධාරීන්ට මැයි 9 වැනිදා මානව හිමිකම් කොමිසම වෙත පැමිණෙන ලෙස දැනුම් දී තිබිණි. හදිසි නීතිය පනවා ඇති කාලසීමාවේ වුවද ජනතාවගේ ඒකරාශීවීමේ සහ භාෂණයේ නිදහසට බාධාවක් නොවිය යුතු බව කොමිසම අවධාරණය කළේය.

මූලාශ්‍ර: http://nethnews.lk

5. **2022 මැයි මස 6 වන දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම.**

ජන ජීවිතය සුරක්ෂිත කොට සමාජ ස්ථාවරත්වය තහවුරු කිරීමට මෙම පියවර ගත් බව රජය නිවේදනය කළ අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, නීතිඥ සංගමය හා විදෙස් රාජ්‍යතාන්ත්‍රිකයින් රැසකගෙන් එම තීරණයට විරෝධය පළ විය. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස මර්දනය කිරීමටත් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට හා රඳවා තබාගැනීමටත් හදිසි නීතිය භාවිත නොකළ යුතු බව නීතිඥ සංගමය නිකුත් කළ නිවේදනයෙන් අවධාරණය කර තිබේ.

මූලාශ්‍රය: https://www.bbc.com

6. **ගෝල්ෆේස් අරගලභූමිය හේතුවෙන් මහජන පීඩාවක් සිදු වන බවට කොටුව පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කිරීම.**

ගෝල්ෆේස් අරගල භූමිය නිසා මහජන පීඩාවක් සිදු වන බවට කොටුව පොලිස් ස්ථානාධිපති විසින් නීතිපති දෙපාර්තමේන්තුව මගින් පිටු 15ක පමණ දීර්ඝ කරුණු දැක්වීමක් නඩු අංක 21990 යටතේ මැයි 6 වැනිදා අලුත්කඩේ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කෙරිණි. මෙම නඩුව මැයි මස 10 වැනිදා සහ 12 වැනිදා නැවත කැඳවූ අතර ජුනි මස 13 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://www.a5news.lk

7. **අරලියගහ මැදුර ඉදිරිපිට හා ගෝල්ෆේස් අරගලභූමිවලට හා උද්ඝෝෂකයින්ට පහරදීමේ සිදුවීමට අදාළව හිටපු අගමැතිවරයා ඇතුළු 17 දෙනෙකුගේ විදෙස් ගමන් තහනම් කිරීමට අධිකරණය නියෝග කිරීම.**

මැයි 12 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් මෙම නියෝගය නිකුත් කෙරුණු අතර මේ සමඟ අදාළ සිදුවීමේ සාක්ෂිකරුවන් හා එහිදී තුවාල ලැබූ උද්ඝෝෂකයින් 7 දෙනෙකුටද විදෙස් ගමන් තහනම් කෙරිණි.

මූලාශ්‍රය: https://www.newsfirst.lk

8. **හිටපු අගමැතිවරයා ඇතුළු 7 දෙනෙකු අත්අඩංගුවට ගැනීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලමින් නීතිඥවරයෙකු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

ගාලුමුවදොර සහ අරලියගහ මන්දිරය ඉදිරිපිට පැවැති සාමකාමී විරෝධතා ව්‍යාපාරවල සිටි පිරිසට පහරදී සාපරාධී බියගැන්වීමකට කුමන්ත්‍රණය කර ඊට ආධාර අනුබල දුන්බව කියන සිද්ධියට අදාළව හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ඇතුළු 07 දෙනකු වහාම අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝගයක් නිකුත් කරන්නැයි ඉල්ලමින් නීතිඥ සේනක පෙරේරා මැයි 13 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

මූලාශ්‍රය: https://www.dailymirror.lk

9. **සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ අදහස් පළ කිරීම් හේතුවෙන්, රූපවාහිනී නිවේදිකාවක අත්අඩංගුවට ගැනීම.**

ප්‍රචණ්ඩත්වයට අනුබල දීමෙන්, පරිගණක අපරාධ පනත යටතේ වරදක් සිදු කළේය යන චෝදනාව මත ජාතික රූපවාහිනියේ නිවේදිකාවක වන වසුන්දරා ගමගේ මැයි මස 18 වැනිදා මෙසේ අත්අඩංගුවට ගැනුණු අතර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: https://www.lankadeepa.lk

10. **මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධිකරණයේ ස්වාධීනත්වයට සිදු කරන ලද බලපෑමක් පිළිබඳව පාර්ලිමේන්තුවේදී හෙළිදරව් වීම.**

ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට නොහැකි වීමට හේතුව, පොලිසිය උද්ඝෝෂණවලට එරෙහි තහනම් නියෝග ඉල්ලා සිටින අවස්ථාවලදී අධිකරණය එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම බවට කරුණු දක්වමින්, ඉහත ලේකම්වරයා අගවිනිසුරුවරයා වෙත මැයි 12 වැනිදා ලිපියක් යොමු කර ඇති බව පා. ම. තලතා අතුකෝරාල මැයි 18 වැනිදා පාර්ලිමේන්තුවේදී හෙළි කළාය. ඉහත ලිපිය අධිකරණයේ ස්වාධීනත්වයට තර්ජයක් බවට බොහෝ පාර්ශ්වවලින් විවේචන පළ වූ අතර, ශ්‍රී ලංකා නීතිඥ සංගමය හා පරිපාලන සේවා සංගමයද ඒ පිළිබඳ නිවේදන නිකුත් කළේය.

මූලාශ්‍ර: 1. http://sinhala.adaderana.lk
2. https://lankaweb.lk

11. **'බුදුන්ගේ රස්තියාදුව' නමින් කෘතියක් ලියා පළ කිරීම සම්බන්ධයෙන් එම කෘතියේ රචකයාට සහ ප්‍රකාශකට එරෙහිව නඩු පැවරීම.**

ඉහත කෘතියෙන් බුදුන්වහන්සේට හා බෞද්ධ ආගමට නිගා කළේය යන චෝදනාව මත ලේඛක කේ.කේ. ශ්‍රීනාත් චතුරංගට සහ ප්‍රකාශක උපුල් ශාන්ත සන්නස්ගලට එරෙහිව මෙම නඩුව පවරා තිබේ. මැයි 20 වැනිදා කොළඹ අංක 1 මහේස්ත්‍රාත් අධිකරණයේදී පළමු වරට මෙම නඩුව කැඳවූ අතර, රු. 50,000 බැගින් වූ ශරීර ඇප මත සැකකරුවන් මුදාහැරිණි. නඩුව සැප් 9 වැනිදාට කල් තබන ලදී.

මූලාශ්‍රය: https://theleader.lk

12. **මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ නඩු විභාගය, නෙදර්ලන්තයේ හේග් නුවරදී "මාධ්‍යවේදී ඝාතනය පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය" හමුවේ ආරම්භ වීම.**

මැයි 12 සහ 13 දිනවල පැවැති මෙම නඩු විභාගයේදී ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, භාෂණ අබේවර්ධන, සන්ධ්‍යා එක්නැලිගොඩ සහ දිල්රුක්ෂි හඳුන්නෙත්ති සාක්ෂි දුන්හ. ලසන්ත ඝාතනය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීමට අපොහොසත් වූ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට එරෙහිව මෙම නඩු විභාගය පැවැත්වේ.

මූලාශ්‍රය: https://ptmurderofjournalists.org

13. **ෆේස්බුක් ඔස්සේ අදහස් පළ කිරීම නිසා හැටන් ප්‍රදේශයේ තරුණසේවා නිලධාරියකු අත්අඩංගුවට ගැනීම.**

කොළඹදී ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයේ නිරතව යෙදී සිටි තරුණ තරුණියන්ට එරෙහිව රාජ්‍ය අනුග්‍රහය ලත් ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට විරුද්ධව ෆේස්බුක් ඔස්සේ අදහස් පෙළ කිරීම හේතුවෙන් හැටන්හි තරුණ සේවා නිලධාරී ආරුමුගම් බාලසුබ්‍රමනියම් මැයි 16 වැනිදා මෙසේ අත්අඩංගුවට ගෙන ඇත. ඔහු හැටන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

14. **සමාජ ක්‍රියාකාරික ඉන්දික ගමගේ අත්අඩංගුවට ගැනීම.**

සමාජ ක්‍රියාකාරිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ සංගමයේ සභාපතිවරයාද වන ඉන්දික ගමගේ මැයි 27 වැනිදා මාතලේ පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි. මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු පල්ලෙකැලේ දුම්බර බන්ධනාගාරයේ රඳවා තැබීමට නියෝග කෙරිණි.

මූලාශ්‍රය: https://twitter.com

15. **විරෝධතාකරුවන්ට කොළඹ මාර්ග කිහිපයකට ඇතුළුවීම වළක්වාලමින් අධිකරණය තහනම් නියෝග යක් නිකුත් කිරීම.**

'ගෝඨාගෝගම' විරෝධතා ව්‍යාපාරයට දින 50ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් මැයි 28 වැනිදා පැවැත්වීමට නියමිත උද්ඝෝෂණවලට පැමිණෙන උද්ඝෝෂකයින් කොළඹ මාර්ග කිහිපයකට ඇතුළුවීම වළකාලන තහනම් නියෝගයක්, කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මැයි 27 වැනිදා නිකුත් කළේය.

මූලාශ්‍රය: https://www.lankadeepa.lk

16. **සමාජ මාධ්‍යවේදියකු හා ක්‍රියාකාරිකයකු වන රතිඳු සේනාරත්න (රැට්ටා) අත්අඩංගුවට ගැනීම.**

'ගෝඨාගෝගම' අරගලයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයකුද වන ඔහු, මැයි 25 වැනිදා අධිකරණය අසල පැවැති උද්ඝෝෂණයකදී මාර්ගය අවහිර කිරීම, පොලිසියේ රාජකාරියට බාධා කිරීම ඇතුළු චෝදනා කිහිපයක් යටතේ මැයි 30 වැනිදා කොම්පඤ්ඤවීදිය පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කෙරිණි. අදාළ චෝදනා පොලිස් ඇප දිය හැකි වැරදි

බව ඔහුගේ නීතිඥයන් පෙන්වා දුන් අතර, ඒ අනුව පොලිසියේ අත්සන් කොට ඔහු මුදාහැරීමට අධිකරණය නියෝග කළේය.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://mawbima.lk

17. **ජන අරගලයේ ක්‍රියාකාරිකයින් වන භික්ෂූන්වහන්සේලා තිදෙනෙකු වීරකැටිය පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

වෑකඳවල රාහුල, දේවාලේගම පේමරතන හා වකමුල්ලේ උදිත යන භික්ෂූන්වහසේලා මැයි 9 වැනිදා වීරකැටියේ කලබලකාරී සිදුවීම්වලට සම්බන්ධ බවට චෝදනා කරමින් වීරකැටිය පොලිසිය මගින් අත්අඩංගුව ගැනුණු අතර වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 31 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි. මේ සම්බන්ධයෙන් විරෝධතා රැසක් පැවති අතර 31 වැනිදා ඔවුන් ඇප මත මුදාහැරිණි. නඩුව ඔක්. 04 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://www.aithiya.lk

18. **හිටපු අගමැති මහින්ද රාජපක්ෂ ඇතුළු මැති ඇමතිවරුන් පිරිසක් මානව හිමිකම් කොමිසමට කැඳවීම.**

අරලියගහ මන්දිරය අසල සහ ගෝල්ෆේස් අරගලවලට පහරදීම සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශනයට අදාළව ප්‍රකාශ ලබා ගැනීම සඳහා මහින්ද රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, රෝහිත අබේගුණවර්ධන, ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ රමේෂ් පතිරණ යන මැති ඇමතිවරුන්ට ජුනි 01 වැනිදා කොමිසම හමුවේ පෙනී සිටින ලෙස දැනුම් දී ඇත.

මූලාශ්‍රය: https://island.lk

19. **වසර 18කට පෙර ඝාතනයට ලක් වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී අයියතුරෙයි නඩේසන් අනුස්මරණය කිරීම.**

රාජ්‍ය අනුග්‍රහය ලත් අතුරු හමුදා සාමාජිකයින් විසින් 2004 මැයි 31 වැනිදා වෙඩි තබා ඝාතනය කරන ලද ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී අයියතුරෙයි නඩේසන් අනුස්මරණය කිරීමේ වැඩසටහන් තුනක් උතුරු හා නැගෙනහිර පළාත්වලදී පැවැත්විණි. මැයි 31 වැනිදා නැගෙනහිර පළාත් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමය හා මඩකලපුව දිස්ත්‍රික් දෙමළ සංගමය විසින් මඩකලපුව ගාන්ධි උද්‍යානයේදීද, මුලතිව් මාධ්‍ය සමාජය විසින් මුලතිව්හිදීද, මැයි 29 වැනිදා යාපනය මාධ්‍ය සමාජය විසින් යාපනයේදීද එම අනුස්මරණයන් පවත්වන ලදි.

මූලාශ්‍ර: 1. https://twitter.com
2. https://twitter.com
3. https://twitter.com

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**මාධ්‍යයේ ස්වාධීනත්වය යන සංරචකයට, සමස්තයක් ලෙස මාධ්‍යයෙහි අන්තර්ගතය තීරණය කිරීමට මාධ්‍යවේදීන්ට ඇති අයිතියට බාහිර පාර්ශ්වවලින් එල්ල වන බලපෑම් ඇතුළත් වේ. මාධ්‍ය හිමිකරුවන්ගෙන් එල්ල වන බලපෑම්ද ඊට අයත්ය. 'වැඩසටහන් සඳහා දේශපාලනඥයින් සහභාගි කර නොගැනීමටට' මාධ්‍ය හිමිකරුවන් ගෙන ඇති තීරණය, පැහැදිලිවම හිමිකරුවන් විසින් ජනමාධ්‍යවේදීන්ගේ කලාපය ආක්‍රමණය කිරීමකි. ඉහත සිදුවීම, 'වෘත්තීයවේදීත්වය' යන සංරචකය යටතේ ඇති 'ස්වයං වාරණය' හා 'තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය' යන දර්ශක යටතේද 'මාධ්‍ය නිෂ්පාදිතයන්ගේ විවිධත්වය හා ගුණාත්මකබව' යන සංරචකයට අයත් 'මාධ්‍ය තුළ සියලු මත සහ මූලාශ්‍ර නියෝජනය වීම' යන දර්ශකය යටතේද සලකා බැලිය හැකිය.**

**4 වගුව: 2022 මැයි : මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය | 01 |
| දේශපාලන බලවතුන්ගේ/හිමිකරුවන්ගේ බලපෑම්වලින් ස්වාධීනත්වය | 01 |
| **එකතුව** | **02** |

1. **අර්බුදය හමුවේ පොදු එකඟතාවකට ඒමට අපොහොසත් වන්නේ නම්, දේශපාලනඥයින් වැඩසටහන්වලට සහභාගී කර ගැනීමෙන් වළකින බව ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංසදය ප්‍රකාශ කිරීම.**

එම සංසදය විසින් මැයි 4 වැනිදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී මේ බව ප්‍රකාශ කළ අතර, දැනටමත් සංසදයේ එක් සාමාජික ආයතනයක්, තම නාලිකාවේ වැඩසටහන්වලට කිසිදු දේශපාලනඥයකු සහභාගී කර ගැනීමෙන් වැළකී ඇති බවද සඳහන් කළේය. මෙම ස්ථාවරය දැඩි විවේචනයට ලක් කරන මාධ්‍ය පර්යේෂක විජයානන්ද ජයවීර පෙන්වා දෙන්නේ, මාධ්‍ය හිමිකරුවන් වැඩසටහන්වල අන්තර්ගතය පිළිබඳ තීරණ ගැනීම හා වාරණයන් පැනවීම මාධ්‍ය නිදහස මෙන්ම ජනතාවගේ තොරතුරු දැනගැනීමේ නිදහසද උල්ලංඝනය කිරීමක් බවයි.

මූලාශ්‍ර: 1 https://www.youtube.com
2. https://www.facebook.com

---

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' සහ දර්ශකයට අයත් වන අවස්ථා 3ක් මැයි මාසයේදී නිරීක්ෂණය විය.**

**5 වගුව: 2022 මැයි : ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| **එකතුව** | **03** |

1. **ආණ්ඩුවට එරෙහිව පවත්වනු ලබන විරෝධතා අතරතුර ළමයින් හිංසනයට ලක් වීම හෙළා දකිමින් UNICEF සංවිධානය නිවේදනයක් නිකුත් කිරීම.**

ළමයින්ට සහ නව යොවුන් වියේ පසුවන අයට සාමකාමීව රැස්වීම්වලට සහභාගී වී තමන්ට බලපාන ගැටලු පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට පිළිගත් අයිතියක් ඇති අතර ළමයින් හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයටත් ප්‍රජාවටත් වගකීමක් ඇති බව එම නිවේදනය අවධාරණය කරයි. පසුගිය දා ඇති වූ විරෝධතාවලදී කුඩා දරුවන් පවා කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වූ අතර එම තත්ත්වය පදනම් කරගෙන UNICEF සංවිධානය විසින් මැයි 7 වැනිදා මෙම නිවේදනය නිකුත් කෙරිණි.

මූලාශ්‍රය: https://www.unicef.org

2. **මානව හිමිකම් හා සිවිල් නිදහස ආරක්ෂා කරන ලෙස ෆැන්සිස් පාප්වහන්සේ ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටීම.**

"ජනතාවගේ අභිලාෂයන්ට ඇහුම්කන් දෙන ලෙසත්, මානව හිමිකම් සහ සිවිල් නිදහස සඳහා පූර්ණ ගෞරවය සහතික කරන ලෙසත් වගකිවයුතු සියලු දෙනාට මම ආයාචනා කරමි." යි ශ්‍රී ලංකාවේ පවතින අර්බුදකාරී තත්ත්වය සම්බන්ධයෙන් මැයි 11 වැනිදා විශේෂ ප්‍රකාශයක් කරමින් පාප්වහන්සේ පැවසූහ. ප්‍රචණ්ඩත්වයට යට නොවී සාමකාමීව කටයුතු කරන ලෙස සියලු පාර්ශ්වවලින් ඉල්ලා සිටින බවද, රටේ සමාජ හා ආර්ථික අභියෝග සහ ප්‍රශ්න හමුවේ මෑත කාලීනව තම හඬ නැගූ තරුණ තරුණියන්ට විශේෂයෙන්ම ආචාර කරන බවද එම ප්‍රකාශයේ සඳහන් වේ.

මූලාශ්‍රය: https://www.vaticannews.va

3. **ගෝඨාගෝගම අරගල භූමියට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා සංවිධාන දෙකක් පොලිස්පතිවරයාට ලිපියක් භාරදීම.**

තරුණ නීතිඥවරුන්ගේ සංගමය හා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය එක්ව මැයි 15 වැනිදා මෙම සංදේශය පොලිස් මූලස්ථානයට භාර දුන් අතර, පරීක්ෂණ සිදු වන ආකාරය අපක්ෂපාතී හා විශ්වසනීය නොවන බවට එමගින් විවේචනාත්මකව කරුණු දක්වා තිබේ. එමගින් වැඩිදුරටත් කියා සිටින්නේ නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් හා පොලිස්පතිවරයාද මෙම අපරාධයේ චූදිතයන් වන බැවින් ඔවුන් වහා ධුරවලින් ඉවත් විය යුතු බවයි.

මූලාශ්‍රය: https://www.bbc.com

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - මැයි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - අප්‍රේල් | | 2022 මැයි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 16 | | 12 |
| නීතිමය කොන්දේසි | 11 | 07 | 19 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 03 | | 01 |
| වෘත්තීයවේදීත්වය | 02 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 07 | 01 | 03 |
| **එකතුව** | **39** | **08** | **35** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-අප්‍රේල් මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවි සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25